ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

**පුවත්පත් නිවේදනය**

**<u>මහ කොමසාරිස්තුමා ඌව පළාතේ ඉන්දීය නිවාස ව්‍යාපෘති බිම්වල සංචාරයක නිරත වෙමින් බහු විධ ක්ෂේත්‍ර සඳහා සහයෝගය පිරිනමයි</u>**

2024 නොවැම්බර් 5 වන දින ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් සන්තෝෂ් ජා මහතා ඉන්දීය නිවාස ව්‍යාපෘතියේ තෙවන අදියර යටතේ ක්‍රියාත්මක ඌව පළාතේ නාරංගල කොටසෙහි සංචාරයක නිරත විය.

2. එතුමා එහිදී ඉන්දීය නිවාස ව්‍යාපෘතියේ ප්‍රතිලාභී පවුල් 54 සමඟ පිළිසඳරක නිරත විය. ඉන්දීය සම්භවයක් සහිත දමිළ ප්‍රජාව ශ්‍රී ලංකාවට පැමිණ වසර 200ක් සපිරීම නිමිත්තෙන් ඉන්දීය රජය විසින් ප්‍රකාශයට පත් කළ ඉන්දියානු රුපියල් මිලියන 750ක බහු විධ ප්‍රදානය යටතේ මහ කොමසාරිස්තුමා විසින් ප්‍රතිලාභී පවුල් වෙත සූර්යබල ලන්තෑරුම් ද බෙදා දෙන ලදී.

3. නාරංගල දමිළ විද්‍යාලයේ සංවිධානය කර තිබූ විශේෂ උත්සවයකදී මහ කොමසාරිස්තුමා බහු විධ ක්ෂේත්‍ර සඳහා විවිධ සහයෝගයන් ද පිරිනැමීය. ප්‍රතිලාභීන්ගේ ඉල්ලීම් මත ලබාදුන් සහයෝගයට ගලඋඩ සහ කන්දගෙදර දිස්ත්‍රික් රෝහල් සහ නාරංගල ඩිස්පැන්සරිය සඳහා විදුලි ජනක යන්ත්‍ර සහ වෛද්‍ය උපකරණ; නාරංගල සහ ලපේර්වත්ත දමිළ විද්‍යාල සඳහා ක්‍රීඩා කට්ටල සහ වතු කම්කරුවන් සඳහා නො. 2 සහ නො. 3 වැහි කබා ඇතුළත් විය.

4. නොවැම්බර් 6 වන දින මහ කොමසාරිස්තුමා ඉන්දියානු නිවාස ව්‍යාපෘතියේ සිව්වන අදියර යටතේ ක්‍රියාත්මක හපුතලේ පිහිටි වැඩබිමක සංචාරයක නිරත විය. එහිදී ප්‍රතිලාභීන් සමඟ අන්තර්ක්‍රියා කළ එතුමා ව්‍යාපෘතියේ ප්‍රගතිය ද නිරීක්ෂණය කළේය.

5. සුවිශේෂී ඉන්දියානු නිවාස ව්‍යාපෘතිය අදියර 4ක් යටතේ ක්‍රියාත්මක වේ. පළමු සහ දෙවන අදියර යටතේ උතුරු සහ නැගෙනහිර පළාත්වල නිවාස 46000ක් ඉදිකිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම සිදු කරන ලදී. තෙවන අදියර ශ්‍රී ලංකාවේ වතුකර ප්‍රදේශයන්හි ක්‍රියාවට නැංවේ. ඒ යටතේ ඉදිකිරීමට සැලසුම් කර ඇති නිවාස 4000 අතරින් නාරංගල කොටසේ නිවාස ද ඇතුළුව නිවාස 3900ක් ඉදිකිරීම් කටයුතු අවසන් කොට ප්‍රතිලාභීන්ට භාර දී තිබේ. සිව්වන අදියර මෑතකදී ආරම්භ වූ අතර ඒ යටතේ හපුතලේ ඇතුළු වතුකර ප්‍රදේශවල නිවාස 10000ක් ඉදි කෙරේ.

***

***2024 නොවැම්බර් 08***
**කොළඹ**